**සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2017**

**----------------------------------------------------------**

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ 21 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

--------------------------------------------------

ප්‍රමිතයේ 56 ඡේදය ප්‍රකාරව මුදල් හා මුදල් සමාන දෑ වල සංරචක හෙළිදරව් කළයුතු වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

--------------------------------------------------

ප්‍රමිතයේ 65 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් එකතුව රු.4,624,280 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොලිය වූ රු.2,129,270 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ මිලදීගත් ලී බඩු හා උපකරණ සඳහා වාර්ෂික ක්ෂය වෙන්කිරීමේ වටිනාකම රු.67,390 ක් වුවද ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් එම අගය රු.144,330 ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.76,940 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් රු.10,000,000 ක් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණද ඒ සඳහා දැරූ වියදම හා ලැබුණු මුදල අතර වෙනස වූ රු.4,511,414 ක් ව්‍යාපෘති අතිරික්තය ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි. එම ප්‍රදානවලින් මිලදී ගෙන තිබුණු රු.2,309,950 ක් වූ ජංගම නොවන වත්කම් වලට අදාල වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම්ගතකිරීම වෙනුවට වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2015 හා 2016 වර්ෂයන්වලට අදාල ගෙවල් කුලී සඳහා අදාල වර්ෂවලදී වෙන්කිරීම සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.9,293,265 ක් අතීතානුයෝගීව ගැලපුම්කර මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම් ලෙස ඉදිරිපත් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අවසන් ගිණුම් අනුව සභාධිපත්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දරන ලද වියදම රු.5,488,586 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රගති සමාලෝචන වාර්තාව අනුව දරන ලද වියදම රු.9,367,000 ක් වූ බැවින් වියදම් අතර වෙනස රු.3,878,414 ක් විය. 2018 වර්ෂයේදී තවදුරටත් දැරීමට ඇති වියදම් පදනම් කරගෙන ප්‍රගති සමාලෝචන වාර්තාව සකස් කර ඇති බව 2018 අගෝස්තු 20 දින සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 වර්ෂයේ මිලදීගත් මෙවලම් හා උපකරණ වටිනාකම රු.696,017 ක් වුවද මෙවලම් හා උපකරණ පිළිබඳ ස්ථාවර වත්කම් උපලේඛනයේ එම අගය රු.684,326 ක් ලෙස සටහන් කර තිබුණු බැවින් උපලේඛනයේ අගය රු.11,691 ක් අධිප්‍රමාණය වී තිබුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.23,157,468 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 06 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය වූ රු.2,930,200 ක් ඇතුළත් විය. මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(i) යථෝක්ත ණයගැතියන් තුළ ඇතුළත් රු.807,187 ක් පුද්ගලික සමාගමකින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1999 වර්ෂයේ ගෙවූ මුදලක් වන අතර එම භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවා තිබූ බැවින් අවුරුදු 18 ක කාලයක සිට එම මුදල් අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ii) රජයේ රෝහල් 02 ක පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු මුදල රු.8,202,098 ක් වන අතර වර්ෂ 05 ට වැඩි ශේෂය රු.346,645 ක් විය. මෙම නඩත්තු කාර්යය අධිකාරියේ විෂය පථය තුළ ඇතුලත් නොවන අතර එය නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කිරීමකින් තොරව ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවිය යුතු රු.3,105,915 ක ශේෂය තුල 2012 වර්ෂයේ සිට පැවත එන රු.774,134 ක ශේෂයක් ඇතුළත් වුවද එම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් අනුව එම කාර්යයන් අවසන් කිරීමට කටයුතු කරන බව සභාපතිවරයා විසින් 2018 අගෝස්තු 20 දින මා වෙත වාර්තාකර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබුණු රු.350,568 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පියවා නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.23,157,468 ක මුළු ණයගැති ශේෂය සඳහා ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට සහාධිපත්‍ය දේපලවල ඇති අනවසර ඉදිකිරීම් සම්බන්ධ විස්තර හා අධිකාරී පනතේ 5 (ඌ) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනවලට පැවරීමට ඇති දේපලවල තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 ඡේදයේ (ඌ) වගන්තිය | සහාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිගාවත්ත, හිඹුටු උයන, රනාල, මත්තෙගොඩ සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී රජයේ නිලධාරීන්ට ලබාදෙන ඉන්ධන දීමනාව සහ දුරකථන දීමනාව ගැලපිය යුතු වුවද, අධිකාරියේ නිලධාරීන් වෙත ලබාදෙන ඉන්ධන දීමනා ගැලපීමෙන් තොරව උපයන විට ගෙවීම් බදු ගණනය කර ගෙවීම් කර තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 454(1)

ගබඩා භාණ්ඩ බාර ගැනීම හා නිකුත් කිරීම මු.රෙ.44 පොදු ආකෘති පත්‍රයෙහි බඩු ලේඛන පොතෙහි සඳහන් කල යුතු අතරම, වාර්තාගත නොකර විවිධ අංශවලට හා නිලධාරීන්ට නිකුත් කරන ලද භාණ්ඩ සඳහා බෙදා හැරීමේ ලැයිස්තු වෙන් වෙන්ව තබාගත යුතු වුවද අධිකාරියේ විවිධ අංශ අතර ඉන්වෙන්ට්‍රි අයිතම හුවමාරු කර තිබුණද ඒවා වාර්තා කිරීමේ පැහැදිලි ක්‍රමවේදයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 454 (2)

අධිකාරියේ ගොඩනැගිලිවල සවිකර ඇති සියළු විදුලි උපාංග සහ උපකරණ පිළිබඳව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් බඩු ලේඛන පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

II වන පරිච්ඡේදයේ 13.3 ඡේදය

වැඩ බැලීමේ පත්වීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද, අධිකාරියේ තනතුරු 04 ක් සඳහා වැඩබැලීමේ පත්වීම් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ බැලීමේ කාලය වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා විහිදී තිබුණි. අධිකාරිය විසින් 2017 වර්ෂයේදී වැඩ බැලීමේ දීමනා ලෙස රු.331,668 ක් ගෙවීම් කර තිබුණි. බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමෙන් පසුව ඉතිරි පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බව සභාපති විසින් වාර්තා කර තිබුණි.

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය

ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත එම වර්ෂයේ අවසන් ගිණුම සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.5 ඡේදය

අධිකාරියේ 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විනාශ කළයුතු හා විකිණිය යුතු භාණ්ඩ සම්බන්ධයෙන් වාර්තා කළද චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය බැහැර කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**
---------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**
--------------

මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ අතිරික්තය රු.98,384,642 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.70,410,879 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,973,763 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම හා මෙහෙයුම් නොවන ආදායම පිළිවෙලින් රු.51,934,856 කින් හා රු. 9,566,391 කින් ඉහළ යාම ඉහත වර්ධනයට මූලිකවම හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය ඌනතාවයක් පෙන්නුම් කල නමුත් අනෙකුත් වර්ෂවල අතිරික්තයක් ලැබී තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු ආයතනයේ සමස්ත දායකත්වය 2014 වර්ෂයේ රු.95,711,528 සිට සමාලෝචිත වර්ෂයේ රු.189,198,902 දක්වා වර්ධනයක් පෙන්නුම් කර තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම වර්ධනය සියයට 30 ක් විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**
------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව ව්‍යාපෘති සේවා ගාස්තු ආදායම හා අළුත්වැඩියා හා නඩත්තු ආදායම පිළිවෙලින් රු.11,000,208 කින් හා රු.2,012,857 කින් අඩුවී තිබුණු අතර කාර්යාල බදු කුලිය රු.15,136,227 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ශුද්ධ වත්කම් රු. 201,174,221 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු. 102,789,579 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ වත්කම් රු. 98,384,642 කින් හෙවත් සියයට 96 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය 3:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ එම අනුපාතය 2:1 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**
------------------------------

**4.1 කාර්යසාධනය**
----------------

**4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**
----------------------------------------

(අ) රාජ්‍ය, පෞද්ගලික හා සුනාමි සහාධිපත්‍ය දේපල වලට අදාල කළමනාකරණ සංස්ථා සහ කමිටු ලියාපදිංචි කිරීම හා අක්‍රීය කමිටු ලියාපදිංචිය අළුත් කිරීම / සක්‍රීය කිරීමට අදාල ප්‍රගතිය සියයට 45 ක් පමණ වූ අතර සුනාමි සහාධිපත්‍ය දේපල සම්බන්ධයෙන් මෙම ඉලක්කගත අරමුණු ඉටුකිරීම ඉතා පහළ මට්ටමක පැවතුණි. මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අධිකාරිය විසින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 191 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඒ සඳහා රු.මිලියන 8.192 ක් වියදම් කර තිබුණු නමුත් කළමනාකරණ කමිටු 46 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. ඒ අනුව සාක්ෂාත් කරගත් ප්‍රගතිය සියයට 45 ක් පමණක් විය.

(ii) කළමනාකරණ සංස්ථා කමිටු ලියාපදිංචිය හා ලියාපදිංචිය සක්‍රීය කිරීම තුළින් රාජ්‍ය , පෞද්ගලික හා සුනාමි අංශයන්හි සහාධිපත්‍ය දේපලවලින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.245,000 ක්, රු.1,120,000 ක් හා රු.350,000 ක් ආදායම් ඉපයීමට සැලසුම් කලද, සුනාමි සහාධිපත්‍ය දේපල වලට අදාල සංස්ථා පිහිටුවීමේ කටයුතු නිසි ආකාරයට සිදුකර නොතිබීම නිසා කිසිඳු ආදායමක් ඉපයීමට නොහැකිවූ අතර රාජ්‍ය අංශයෙන්ද ලැබූ ආදායම රු.95,868 ක් පමණක් විය.

(ආ) අධිකාරිය විසින් 2017 වර්ෂය තුලදී පැමිණිලි 120 ක් සඳහා නියෝග ලබාදීමට සැලසුම් කළද, වර්ෂය අවසානයට පැමිණිලි 82 ක් සඳහා පමණක් විසඳුම් ලබාදීමට කටයුතු කර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණු 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේ හා 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් පනතේ සංශෝධන කටයුතු අදාල වර්ෂයේදී නිමකර නොතිබුණු බැවින් 2017 වර්ෂය අවසානය දක්වා කාලය දීර්ඝ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම පනත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම පමණක් සිදුකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී සහාධිපත්‍ය දේපල 160 ක් රක්ෂණය කිරීම සඳහා හා අනවසර ඉදිකිරීම් 40 ක් ඉවත් කිරීමට හා ඒ වෙනුවෙන් දරන ලද වියදම අදාල පාර්ශවකරුවන්ගෙන් අයකර ගැනීමට සැලසුම් කර තිබුණද එකඳු දේපලක් හෝ රක්ෂණය කර නොතිබුණි. අනවසර ඉදිකිරීම් 04 ක් ඉවත් කර තිබුණු බවත් රජයේ පැරණි නිවාස ක්‍රමවල රක්ෂණ කටයුතු කළමනාකරණය කිරීමට කළමනාකරණ සංස්ථා ක්‍රියා නොකරන බැවින් රක්ෂණ කටයුතු අක්‍රියව පවතින බවත් පෞද්ගලික අංශය මගින් ඉදිකරන නිවාස ක්‍රමවල රක්ෂණ කටයුතු සාර්ථකව සිදුවන බවත් සභාපතිවරයා විසින් 2018 අගෝස්තු 20 දින වාර්තා කර තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු.15,559,519 ක් ගෙවල් කුලී ලෙස ගෙවීම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවල් කුලී ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ආ) නිවාස අධිකාරිය සතු කාර්යාල ගොඩනැගිල්ලේ වැඩිදියුණු කිරීම් වෙනුවෙන් හා කාර්යාල පරිශ්‍රයේ ගරාජයක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය විසින් රු.1,202,084 ක වියදමක් දරා තිබුණු නමුත් එම මුදල් නිවාස අධිකාරිය වෙත ගෙවනු ලබන බදු කුලියෙන් අඩුකර ගැනීමට හෝ වෙනත් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ ගිවිසුමක් ඇතිකර ගැනීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරන අධිකාරී පනතට අනුව අධිකාරිය විසින් සහාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථා සක්‍රීයව පවත්වා ගෙන යායුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරිය විසින් පිහිටුවන ලද කළමනාකරණ සංස්ථා 936 කින් 364 ක් එනම් සියයට 39 ක් අක්‍රීයව පැවතුණි.

**4.4 අරමුදල් ඌන උපයෝජනය**

අධිකාරිය විසින් සිදුකරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වාර්ෂිකව ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන අදාල වර්ෂයෙහි අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ පෙන්නුම් කරනු ලබන අතර 2017 වර්ෂයේදී එම මුදල රු.25,421,000 ක් වූ අතර 2016 වර්ෂයේදී රු.42,209,311 ක් වී තිබුණි. කොන්ත්‍රාත්කරු අදාල කාර්යයන් නොකිරීම නිසා ප්‍රතිපාදන ඉතිරිවූ බවත් එම ඉතිරිවීම් අමාත්‍යාංශය වෙත මුදාහැරීමට කටයුතු කරන බවත් සභාපතිවරයා 2018 අගෝස්තු 20 දින මා වෙත වාර්තා කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්**

2014 හා 2015 වර්ෂයන්හි මිලදීගත් තීන්ත ලීටර් 18 ක් හා 2007 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදීගත් විදුලි හා ජලනල උපාංග අයිතම 25 කට අයත් ඒකක 207 ක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවති අතර, එම අයිතම අවශ්‍යතාවය අනුව නිකුත් කරන බව සභාපති විසින් 2018 අගෝස්තු 20 දින මා වෙත වාර්තාකර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 139 ක් හා 115 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය, සංවිධාන සටහන හා බඳවාගැනීමේ පරිපාටිය අනුව නීති කටයුතු වෙනුවෙන් සහකාර සාමාන්‍යාධිකාරි තනතුරු දෙකක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් එක් තනතුරක් සඳහා පමණක් නීති නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. සේවයේ අවශ්‍යතාවය හඳුනාගෙන ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීම වෙනුවට 2008 වර්ෂයේ සිට දෛනික ගෙවීම් පදනම මත වෙනත් නීති නිලධාරියකුගේ සේවය ලබා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් එම නීති නිලධාරිගේ කාර්යයන් වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.554,000ක් ගෙවීම් කර තිබුණි. එම ක්ෂේත්‍රයේ කටයුතු කිරීමට ප්‍රවීණ නීතිඥවරයෙකුගේ අවශ්‍යතාවය පැවතුනද අධිකාරියේ වැටුප් ක්‍රමයට එවැනි නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකි බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව තාවකාලික නීතිඥවරයෙකුගේ සේවය ලබා ගන්නා බව සභාපති විසින් වාර්තා කර තිබුණි.

(ආ) අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 01ක්, සහකාර සාමාන්‍යාධිකාරි තනතුරු 05 ක් සහ අනෙකුත් මාණ්ඩලික තනතුරු 13 ක් දීර්ඝ කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යසාධනයට සෘජුවම බලපා නැතැයි යන්න විගණනයෙන් බැහැර කළ නොහැකි විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් එම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසාර සංවර්ධන ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් තිරසාර අරමුණු වන සහාධිපත්‍ය දේපලවල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් හොඳින් නඩත්තු කරගෙන යාම, පරිපාලනය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබාදීම හඳුනාගෙන ඊට අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය සංධිස්ථානයන් දක්වා තිබුණද එහි ප්‍රගතිය මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සඳහා වෘත්තීය කුසලතා ඇති නිලධාරීන් නොමැතිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ආකෘතිය ප්‍රකාරව අධිකාරිය විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) කතරගම සංචාරක බංගලාව නවීකරණයට අදාල කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 හි දක්වා ඇති පරිදි ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගතවන ලියවිලි ඇතුළත් කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් පිරිවිතර සකස් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.177,390 කට මුද්‍රණ යන්ත්‍ර 04 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ හා අනුමැතීන් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂය සඳහා අනුමත ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනයකින් තොරව, එහි ඇතුළත් නොවූ එකතුව රු.3,542,806 ක කාර්යයන් අධිකාරිය විසින් සිදුකර තිබුණි.

(ඉ) 2017 හා 2016 වර්ෂයන්හි ප්‍රසම්පාදන සැලැසුම් මගින් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට ඉඩමක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය සිදු කර නොතිබූ අතර 2018 ප්‍රසම්පාදන සැලැස්මටද ඇතුළත් කර තිබුණි.

(ඊ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මෙහි වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඇතුළත් වී නොතිබුණි.

**6.2 අයවැය පාලනය**

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 26 සිට සියයට 307 දක්වා විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි.

**6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

අධිකාරිය විසින් 2015 සහ 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2018 ජූලි වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සභාධිපත්‍ය දේපල කළමනාකරණය | - කළමනාකරණ සංස්ථා අධීක්ෂණය විධිමත් නොවීම.<br>- සභාධිපත්‍ය දේපලවල පොදු පහසුකම් පැවරීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු නොකිරීම.<br>- අනවසර ඉදිකිරීම් සම්බන්ධ වාර්තා පවත්වා නොතිබීම. |
| (ආ) | අග්‍රිම පාලනය | - අත්තිකාරම් පියවීම ප්‍රමාදවීම<br>- කලින් ලබාගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත එම නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම<br>- මාණ්ඩලික නොවන නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ අත්තිකාරම් 2018<br>- වර්ෂයේදී භාවිතා කිරීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | - නිසි ක්‍රමවේදයකට අනුව මිලදී ගැනීම් වෙන වෙනම හඳුනා ගැනීමට ලිපිගොනු නඩත්තු නොකිරීම |
| (ඈ) | ඉන්වෙන්ට්‍රි පාලනය | - එක් එක් අංශ වෙනුවෙන් වෙන වෙනම බඩු ලේඛන පොත් පවත්වා නොතිබීම |